# ශුද්ධ ගණිතයෙන් ලොව නම රැන්දූ ශ්‍රී ලාංකිකයා

**ආචාර්ය ජයන්ත සේනාධීර**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**



ආචාර්ය එච්. සෝමදාස

**ශ්‍රී ලාංකිකයෙකු වශයෙන් ශුද්ධ ගණිත පර්යේෂණ ක්ෂේත්‍රය තුළ අන්තර්ජාතිකව කීර්තිමත් නමක් රැන්දූ ආචාර්ය එච්. සෝමදාස මහතා පසුගියදා අසූ අට හැවිරිදි වියේ දී සිය දිවි සැරිය නිම කළේ ය.**

ගාල්ල ප්‍රදේශයේ ජන්ම ලාභය ලැබූ ආචාර්ය සෝමදාස මහතා ගිංතොට මහා විද්‍යාලයෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලැබී ය. අනතුරුව ඔහු හික්කඩුව ශ්‍රී සුමංගල මධ්‍ය විද්‍යාලයෙන් ද්විතීයික අධ්‍යාපනය ලබා උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා ලංකා විශ්වවිද්‍යාලයට ඇතුළත් විය.

1960 දී ලංකා විශ්වවිද්‍යාලයෙන් තම ප්‍රථම උපාධිය ලබාගෙන එම වසරේදීම (පසු කලෙක කැලණිය විශ්වවිද්‍යාලය බවට පත් වූ) විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ගණිතය පිළිබඳ සහකාර කථිකාචාර්යවරයෙකු ලෙස තම වෘත්තීය ජීවිතය ඇරඹීය. අනතුරුව ශිෂ්‍යත්වයක් ලැබ ගණිතය පිළිබඳ ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා එංගලන්තයේ ස්වන්සී විශ්වවිද්‍යාලයට (University College of Swansea) ඇතුළත් විය. ඔහු තම පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගත්තේ සංකීර්ණ විශ්ලේෂණයේ (Complex Analysis) ඇතුළත් "බ්ලැෂ්කි ගුණිත" (Blaschke products) ආශ්‍රිත අධ්‍යයනයකි. මෙම බ්ලැෂ්කි ගුණිත පිළිබඳව ඔහු විසින් ගොඩනගන ලද ප්‍රමේයයක් පසු කලෙක ගණිතඥයන් විසින් "සෝමදාස ප්‍රමේයය" (Somadasa's Theorem) ලෙස භාවිත කරන ලදි. ඔහුගේ එම ප්‍රමේයය ඇතුළත් පර්යේෂණ පත්‍රිකාව 1966 දී Blaschke Products with 'ero Tangential Limits යන මැයෙන් කීර්තිමත් ලන්ඩන් ගණිත සංගමයේ ජර්නලය වන Journal of the London Mathematical Society හි පළ විය. ඔහුගේ බ්ලැෂ්කි ගුණිත පිළිබඳ පර්යේෂණ පත්‍රිකා ලොව ප්‍රකට ගණිත විෂය සම්බන්ධ ජර්නල ගණනාවක පළ වී ඇත. මේ ක්ෂේත්‍රයේ පර්යේෂණ කළ ගණිතඥයන්ගේ නොමඳ අවධානය ඒ සඳහා යොමු විය.

ඔහු 1966 දී ගණිතය පිළිබඳ තම ආචාර්ය උපාධිය සම්පූර්ණ කළේ ය. මේ යුගයේ දී ශ්‍රී ලාංකිකයෙකු ශුද්ධ ගණිතය වැනි ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් ලබා ගැනීම සුලබ නොවීය. ආචාර්ය සෝමදාසයන්ට පෙර මෙම විෂය සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික ආචාර්ය උපාධිධාරීන් සිටියේ දෙදෙනෙකු පමණි. ආචාර්ය උපාධිය ලබාගැනීමෙන් පසුව සෝමදාස මහතා යළි ශ්‍රී ලකාවට පැමිණ 1979 තෙක් කැලණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් වශයෙන් සේවය කළේ ය. අනතුරුව ඔහු නයිජීරියාවේ විශ්වවිද්‍යාලයක කථිකාචාර්ය ධූරයකට තෝරා ගන්නා ලදි. 1982 දී ඔහුගේ නම අන්තර්ජාතික ගණිත සංගමය (International Mathematical Union) විසින් පළ කරන ලද ගණිතඥයින් පිළිබඳ අන්තර්ජාතික නාමාවලියට ද ඇතුළත් විය.

1983 දී යළි ශ්‍රී ලංකාවට පැමිණි ආචාර්ය සෝමදාස අලුතෙන් පිහිටුවන ලද ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ගණිත අංශයේ ප්‍රථම අංශාධිපති ලෙස වැඩ භාරගත්තේ ය. ඔහු විවෘත විශ්වවිද්‍යාලයේ ගණිත අංශයේ ආරම්භක විෂයමාලාවන් සකස් කිරීමේ දී මූලිකත්වය ගත් අතර, පසුකාලීනව ඔහුගේ අධ්‍යයනවල අවධානය දුරස්ථ අධ්‍යාපනය සහ විවෘත විශ්වවිද්‍යාල හරහා ගණිතය ඉගැන්වීම සම්බන්ධයෙන් ද යොමු විය. මේ අයුරින් ඔහු විශ්‍රාම යන තෙක්ම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට අනුපමේය සේවයක් සැපයීය. ආචාර්ය සෝමදාසයන්ගේ සේවය ඇගයීම පිණිස ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් 2018 වසරේ සිට ඔහුගේ නමින් වන එච්. සෝමදාස රන් පදක්කම (H. Somadasa Gold Medal for Excellence in Pure Mathematics) සෑම වසරකම ප්‍රථම උපාධිය ලබා ගන්නා සිසුන් අතරින් ශුද්ධ ගණිතය සඳහා විශිෂ්ටතම දස්කම් දක්වන සිසුවාට ප්‍රදානය කරනු ලැබේ. ■